# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 60 දරන
# වගකීමෙන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]
ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1988 අංක 60 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 64/88

## 1982 අංක 20 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 60 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1982 අංක 20 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනතේ දීර්ඝ නාමය, "1977 අගෝස්තු මස 31 වන දින දක්වා වූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අදාළ දිනය දක්වා වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. *1982 අංක 20 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි "1977 අගෝස්තු මස 31 වන දින දක්වා වූ" යන වචන වෙනුවට "අදාළ දිනය දක්වා වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියෙන් ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කරන අතර, එය ඒ ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන අලුත් වගන්තිය එකතු කිරීම.*

*"අර්ථ නිරූපණය.*

3. මේ පනතේ කාර්ය සඳහා "අදාළ දිනය" යන්නෙන්, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනය අදහස් වේ.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.